# රුවන්වැලිය හා අසෝකමාලා

ගැමුණු රජු රුවන්වැලි සෑය නිර්මාණය කිරීමට පෙර එහි තිබූ දේවාලය ගාඩි කුලයේ කාන්තාවක වෙනුවෙන් ඉදිකෙරී තිබුණු බවට ජනප්‍රවාදයේ සාක්ෂි වෙයි. අප කලින් සඳහන් කර ඇති පරිදි වැදි ගෝත්‍රය හා ගාඩි කුලය (වංශය) සිංහල ජාතියෙන් පිටත තිබී ඇත. ඇතැම් විට ආන්ද්‍ර ප්‍රදේශයෙන් මෑතක දී මෙරට පැමිණි පිරිස් මෙකී කුලයට එකතුවන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ කෙසේ වෙතත් අද රුවන්වැලි සෑය පිහිටි තැන එදා තිබී ඇත්තේ ගාඩි කුලයේ රත්නවල්ලී දෙවගන, එනම් එම කුලයේ මියගිය කාන්තාවක්, වෙනුවෙන් ඉදි කෙරී තිබුණු දේවාලයකි.

බුදු දහම පැතිරයෑමට පෙර මෙරට දේවාල තිබූ බවට සාක්ෂි වෙයි. යක්ෂයන්ගේ දේවාල, ගාඩි කුලයේ අයගේ දේවාල මෙන් ම වැදි ජනයාගේ දේවාල ද මෙරට තිබී ඇත. වෙනත් ගෝත්‍රවල ද දේවාල තිබුණු බවට සැකයක් තිබිය හැකි නො වෙයි. රත්නපුර සමන් දේවාලය බොහෝ විට දේව ගෝත්‍රයේ ජනයාගේ දේවාලයක් වන්නට ඇත. යක්ෂයන්ගෙන් ඇතැමකු සිංහල ජාතියට එකතුවීමට තිබූ අකමැත්ත හේතුවෙන් හා ගාඩි කුලයේ ජනයා සිංහල ජාතියෙන් පිට සිටි හෙයින් ඔවුන්ගේ දේවාල වෙනම ම පවත්වාගෙන යන්නට ඇත. එහෙත් සිංහල ජාතිය බවට පත්වූ ගෝත්‍රවල දේවාල සිංහලයන්ගේ දේවාල බවට පත්වීම ස්වාභාවික ය.

සිංහලයන් බෞද්ධයන් වූ පසු පන්සල් තැනීම සම්බන්ධයෙන් දෙයාකාරයකට කටයුතු කරන්නට ඇත. ඇතැම් විට ඔවුන් අමුතුවෙන් ම විහාරස්ථාන ගොඩනැගීම සඳහා කටයුතු කරන්නට ඇත. අනෙක් අතට තමන්ගේ දේවාල විහාරස්ථාන බවට පත්කරන්නට ද ඔවුන් කටයුතු කරන්නට ඇත. එහි දී පන්සලෙහි ම දේවාලයෙහි කොටසක් ඇතැම් විට ඉතිරි වූ බව පැහැදිලි ය. සිංහල බුද්ධාගමෙහි හෙවත් සිංහලයන්ගේ බුද්ධාගමෙහි දෙවියන්ට හා දේවාලවලට සෑමදාමත් ඉඩක් තිබී ඇත. අද පවා පන්සල්වල දේවාල ඇත්තේ මේ පැරණි ඓතිහාසික සම්බන්ධතාව හේතු කොට ගෙන ය.

එසේ නැතිව සිංහල රජවරු දක්ෂිණ භාරතයෙන් දෙමළ හින්දු බිසොවුන් ගෙනැවිත් ඔවන් සඳහා පන්සලේ ම තැනක දේවාලයක් ඉදිකෙළේ යැයි පැවසීම සිංහලයන්ට හා ඔවුන්ගේ බුද්ධියට වර්තමානයේ උගතුන් යැයි කියන්නන් කරන නිග්‍රහයක් වෙයි. දකුණු ඉන්දියාවෙන් එසේ පැමිණි යැයි කියන බිසොවුන්ට තම ආගමික කටයුතු කරගැනීම සඳහා තැනිය යුත්තේ කෝවිල් මිස දේවාල නො වෙයි. එහෙත් මගේ දැනුමට අනුව නම් ලංකාවේ පන්සල්වල ම පිහිටි කෝවිල් දක්නට ඇත්නම් ඒ ස්වල්පයක් විය යුතු ය. ලංකාවේ පන්සල්වල දක්නට ඇත්තේ දේවාල මිස කෝවිල් නො වෙයි. මේ දේවාලවලට අර බිසොවුන්ට වඩා ඈතට දිවෙන ඉතිහාසයක් ඇත.

ලංකාවේ පන්සල්වල ඇති දේවාල ගැන මෙන් ම පන්සල්වලින් බාහිර ව ඇති දේවාල හැන ද අපේ ඇසින් බලා අපේ ප්‍රවාද ගොඩනැගීමේ දී ඉහත සඳහන් කරුණු වැදගත් වේ යැයි සිතමි. දේවාල යනු පසු කලෙක හුදෙක් හින්දු ආගමෙන් අවශෝෂණය කරගනු ලැබූ දෙවියන් උදෙසා තනන ලද සිද්ධස්ථාන පමණක් නො වෙයි. පත්තිනි දේවාල එවැනි හින්දු ආගමින් සිංහල බුද්ධාගමට අවශෝෂණය කරගනු ලැබූ දෙවියන් මුල්කරගත් දේවාල වෙයි. එහෙත් එයට වඩා පැරණි ඉතිහාසයක් දේවාලවලට ඇත. සිංහලයන් බෞද්ධයන් වීමට පෙර ඔවුන්ගේ සිද්ධස්ථාන වූයේ දේවාල බව පැහැදිලි ය. හින්දු ආගමින් අවශෝෂණය කරනු ලැබූ දෙවියන් වෙනුවෙන් ද කෝවිල් ඉදි නොකර දේවාල ඉදිකර ඇත්තේ දේවාලවල ඇති ඓතිහාසික බලපෑම හේතුකොටගෙන ය.

රජවරුන්ට දක්ෂිණ භාරතයෙන් ආනයනය කරන ලද බිසොවුන් සමග ද ඇතැම්විට හින්දු දෙවියන් කිහිප දෙනකු ද මෙරටට හඳුන්වා දීමට ඉඩක් නොතිබුණා නො වෙයි. එහෙත් ඒ දෙවියන් ද පළමුව සිංහල බුද්ධාගමට අවශෝෂණය කෙරිණි යැයි අපට සිතාගත හැකි ය. එසේ හින්දු දෙවියන් සිංහල බුද්ධාගමෙහි දෙවියන් බවට පත්වූ පසු ඔවුන් වෙනුවෙන් දේවාල ඉදිකෙරෙන්නට ඇත. එසේ නැතිව බිසොවුන් වෙනුවෙන් පමණක් විහාරස්ථානයේ තැනක හින්දු දෙවි කෙනකු වෙනුවෙන් ඉඩක් වෙන්කිරිණි යැයි සිතීම වත්මන් අනුකාරක මනස නිසා සිදුවන්නකි.

© Prof. Nalin De Silva

සිංහල බුද්ධාගම යනු සංස්කෘතික අච්චාරුවක් නො වේ. අද ඇතැම් පඬිවරුන් කියන්නේ අප අතනින් මෙතනින් යම් යම් දේ ගෙන ඊනියා සංස්කෘතික මිශ්‍රණයක් තනාගත යුතු බව ය. සිංහල ජාතිකත්වය සමග මාක්ස්වාදය මිශ්‍රකිරීමට ඇතැම්හු උත්සාහ කරති. ඇතැම් පඬිවරු ඒ සඳහා උපදෙස් දෙති. ගුණදාස අමරසේකර මහතා ද අවුරුදු විස්සකට පමණ පෙර එවැනි අදහසක් දැරී ය. සංස්කෘතිය යනු මිශ්‍රණයක් (mixture) හෝ සංයෝගයක් (compound) හෝ නො වෙයි. A හා B යන ද්‍රව්‍ය දෙකෙහි මිශ්‍රණයෙන් පසුව ද ඒ ද්‍රව්‍ය දෙක කිසිම වෙනසක් නැතිව ඒ ආකාරයෙන් ම පවතියි. සීනි හා වැලි මිශ්‍ර කිරීමෙන් ලැබෙන මිශ්‍රණයේ ඇත්තේ සිනි හා වැලි මිස වෙනත් අළුත් ද්‍රව්‍යයක් නො වෙයි. සංස්කෘතීන් එකතුවන්නේ ද එලෙස මිශ්‍රණ ලෙස නම් අදාළ සමාජයෙහි ඒ ඒ සංස්කෘතීන් එලෙස ම පවතිනු ඇත.

අනෙක් අතට ද්‍රව්‍ය දෙකක සංයෝගයක් යනු අළුත්ම ද්‍රව්‍යයකි. එහි මුල් ද්‍රව්‍ය දෙක ඒ ආකාරයෙන් නැත. උදාහරණයක් ලෙස හයිඩ්‍රජන් වායුව හා ඔක්සිජන් වායුව රසායනික ව ක්‍රියාකිරීමෙන් නිර්මාණය වන ජලයෙහි පළමු වායු දෙකෙහි ගුණ දකින්නට නැත. සංස්කෘතීන් දෙකක් ඒ ආකාරයෙන් මිශ්‍ර වීමක් හෝ සංයෝග වීමක් හෝ නො වෙයි. C නම් සංස්කෘතියක යම් අංගයක් වෙනත් D නම් සංස්කෘතියක් තුළට නිර්මාණශීලීව අවශෝෂණය කෙරෙයි. එමගින් C නම් සංස්කෘතියට කිසිවක් නො වෙයි. එහෙත් D නම් සංස්කෘතිය සුළු වශයෙන් හෝ වෙනස් වෙයි. එහෙත් ඒ හේතුවෙන් D නම් සංස්කෘතිය මුළුමනින් ම වෙනස් නො වෙයි.

අද ඇතැම් විට මේ අවශෝෂණය නො සිදුවෙයි. එයට හේතුව බටහිර සංස්කෘතික ආධිපත්‍යය හා සිංහල සංස්කෘතිය සම්බන්ධයෙන් නම් නිර්මාණශීලීත්වය පිරිහීම ය. බටහිර විද්‍යාව ඇතුළු බටහිර දැනුම සම්බන්ධයෙන් ගත්කල අද ආසියාවේ හෝ අප්‍රිකාවේ හෝ එක රටකවත් අවශෝෂණයක් නො සිදුවෙයි. අප රටවල සියළු දෙනා කරන්නේ බටහිර දැනුම ඒ ආකාරයෙන් ම ගෙඩිය පිටින් ම ගැනීම ය. බටහිර සංස්කෘතික ආධිපත්‍යය නිසා කෙරෙන මේ අනුකරණය අපේ හිත සුව පිණිස නම් නො වෙයි.

අපේ අනුකාරක මනසට පෙනෙන්නේ භාරතයෙන් ගෙන්වනු ලැබූ බිසොවුන්ට විහාරස්ථානයේ දේවාල තනනු ලැබූ බව ය. ඒ අර සංස්කෘතිය ද මිශ්‍රණයක් ලෙස සිතන්නට සලස්වා තිබීමේ ප්‍රතිඵලයකි. අඩුම තරමින් බිසොවුන්ට විහාරස්ථානයේ කෝවිල් නොසෑදුවේ ඇයි දැයි ප්‍රශ්න කිරීමට පුහුණු කෙරී තිබිණි නම් අපට මේ අකරතැබ්බයට මුහුණ පෑමට නො සිදුවෙයි. අපට සිංහල බුද්ධාගම ලැබුණේ සිංහල සංස්කෘතියට බුදු දහම අවශෝෂණය කිරීමෙනි. ඕල්කට් බෞද්ධයන්ගේ ගැරහීමට ලක්වීමෙන් පසුවත් සිංහල සංස්කෘතියේ දේවාල අප අද වන තුරුත් පවත්වාගෙන යන්නේ එකල සිංහලයන්ගේ නිර්මාණශීලීත්වයේ ප්‍රතිඵලයක් ලෙස ය.

අපි නැවතත් රුවන්වැලි සෑයට යමු. රත්නවල්ලී දෙවගන නමින් පවත්වාගෙන ගිය දේවාලය සිංහල ජාතියට එක් නොවුණු ගාඩි කුලයේ සිද්ධස්ථානයක් විය. ගැමුණු රජ දවස මේ කුලය සිංහල ජාතිය තුළට ගැනීමේ වුවමනාවක් සමහරවිට තිබෙන්නට ඇත. සාලිය අසෝකමාලා (අසෝකවල්ලී) පුවතින් කියැවෙන්නේ ද එය විය හැකි ය. අඩුම තරමින් අසෝකවල්ලී යන නම සිංහල සංස්කෘතියෙහි අසෝකමාලා වන්නට ඇතැයි සිතෙයි. වල්ලි යනු වැල ය. එනම් මාලාව ය. ගෝත්‍රික සංස්කෘතියෙහි වල්ලි සිංහල සංස්කෘතියෙහි මාලා වීම අහම්බයක් විය නො හැකි ය. කෙසේ වුවත් මේ පරිවර්තනයෙහි යම් අර්ධ වෛදික ආභාසයක් ඇතැයි සිතිය හැකි ය වල්ලි අම්මලා හා වල්ලි එතනලා මොන තරම් ඉතිහාසයක් සඟවාගෙන සිටිත් ද?

එළාර රජු (ප්‍රාදේශීය ව බලවත් වූ අයකු) පරාජය කර සිංහල බෞද්ධ රාජ්‍යයක් මෙරට පිහිටු වූ ගැමුණු කුමරු ගාඩි කුලය සිංහල රාජ්‍යය තුළට ගැනීමට උත්සාහ කෙළේ නම් ඒ පුදුමයක් නො වෙයි. රුවන්වැලිය මෙන් ම සාලිය අසෝකමාලා ප්‍රේම වෘත්තාන්තය ද ඒ ප්‍රයත්නය අප හමුවේ ජීවමාන ව පවත්වාගෙන යයි. අසෝක වනයේ මාලා ගෙතූ වල්ලි රජුගේ පුතාගේ පෙම්වතිය වූවා ය. රත්නවල්ලී දෙවගන වෙනුවෙන් තැනූ දේවාලය වෙනුවට ඇගේ නමින් ම මහා සෑය බැඳිණි.

රුවන්වැලි සෑය එනමින් හෝ එහි වෙනත් ස්වරූපයකින් හෝ හැඳින්වීම ගාඩි කුලයේ ප්‍රධානීන් හා ගැමුණු රජු අතර ඇතිවූ එකඟතාවට අනුව සිදුවන්නට ඇත. කුල ප්‍රධානීන් එවැනි ඉල්ලීමක් කරන්නට ඇත. සමහරවිට ගැමුණු රජතුමා ම ඒ යෝජනා කරන්නට ඇත. කෙසේ හෝ රජතුමා සහ කුල ප්‍රධානීන් අතර යම් එකඟතාවක් තිබෙන්නට

© Prof. Nalin De Silva

ඇත. අද කියන ආකාරයට එදා ද ගිව්සුමක් වී නම් එසේ වී නම් රුවන්වැලි යන්න රත්නවල්ලි යන්නෙහි පසුකාලීන පෙරළුමක් ලෙස සැලකිය හැකි ය. ස්වර්ණමාලී යන්න ද එහි තවත් පෙරළුමකි. එහෙත් ඒ රුවන්මැලි සෑය යන ආකාරය නො ගනියි. මහාසෑය මුල දී නම්කරන්නට ඇත්තේ රත්නවල්ලි සෑය ලෙස යැයි සිතිය හැකි ය.

අද අපට නැවතත් මහාසෑය රත්නවල්ලි මහාසෑය ලෙස හැඳින්වීමේ ඉඩක් නැත. එහෙත් රුවන්වැලිය සිංහල බෞද්ධයන්ගේ මහාසෑය වෙයි. මහාවංශය රුවන්වැලි සෑය වෙනුවෙන් ගාථා රාශියක් ම වෙන්කරයි. ඉන්පසුව අභයගිරිය හා ජේතවනය ඉදිකෙරුණ ද රුවන්වැලිය විශාලම චෛත්‍යය නොවුණ ද ඒ මහාසෑය වන්නේ ඇයි? ඇතැමුන් කියනු ඇත්තේ රුවන්වැලිය මහාවිහාරයට අයත් වැවින් හා මහාවංශය මහාවිහාර පරම්පරාවේ භික්ෂූන් වහන්සේ නමක අතින් ලියැවුණු ඒ මහාසෑය ලෙස හඳුන්වන්නට ඇත කියා ය. එහි බැලූ බැල්මට සත්‍යයක් වෙයි. එසේ වුවත් මහාවංශය යනු හුදෙක් මහානාම හිමියන්ගේ කෘතියක් නො වෙයි. අප කලින් සඳහන්කර ඇති පරිදි දීපවංශයෙහි මෙන් ම මහාවංශයෙහි ද සඳහන් වන්නේ එයට පෙර තිබූ පොත්වල තිබූ කරුණුත් ජනප්‍රවාදයෙහි සඳහන් කරුණුත් ය. දීපවංශය ද මහාවිහාරික පාර්ශ්වයේ ම ග්‍රන්ථයක් වුවත් එහි ගැමුණු රජතුමා ගැන හෝ මහාසෑය ගැන හෝ මහාවංශයෙහි තරම් විස්තරයක් ඇතුළත් නො වෙයි. එබැවින් රුවන්වැලිය මහාවිහාරයේ සෑයක්වීම නිසා ම ඕනෑම මහාවිහාරික කතුවරයකු ඒ පිළිබඳ ව විස්තරාත්මක ව සඳහන්කරාවි යැයි නො සිතමු.

මෙහි දී මහාවංශය ලිවීම පිළිබඳ දෙවැනි කරුණක් සඳහන් කළයුතු ය. මහාවංශය ලියැවුණු කාලය මෙහි දී වැදගත් වෙයි. සතුරු ආක්‍රමණ ඇති වූ කලක සිංහල ජාතියේ ඉතිහාසය පෞඪ ආකාරයකින් ලිවීම මහානාම හිමියන්ගේ අවශ්‍යතාව වූවා නිසැක ය. සිංහල බෞද්ධ රාජ්‍යය නිර්මාණය කළ ගැමුණු රජු ගැන දීර්ඝ විස්තරයක් මහාවංශයට ඇතුළත් විය යුතුව තිබුණි. එමෙන් ම අප දක්නා ආකාරයට රුවන්වැලි මහාසෑය සිංහල බෞද්ධ රාජ්‍යය ගොඩනැගීමේ සංකේතය ද විය. මහානාම හිමියන් රුවන්වැලි සෑය පිළිබඳ දීර්ඝ විස්තරයක් කරන්නේ එබැවිනි. ඉන්පසු එයට වඩා විශාල චෛත්‍ය නිර්මාණය වුව ද සිංහල බෞද්ධත්වය යම් ආකාරයකින් පරිපූර්ණත්වයකට පත්කරනු ලැබුයේ ඒ චෛත්‍යයෙනි. සිංහල බෞද්ධයන්ට අදත් ඒ සෑය මහාසෑය වන්නේ එබැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva